සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය

# ගෘහ ආර්ථික විද්‍යාව - I

කාලය පැය 01 යි.

නම/ විභාග අංකය:

උපදෙස් :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

01. පැළවූ ධාන්‍ය හා මාංශ බෝගවලින් සැපයෙන සැකරයිඩයකි.
(1) ලැක්ටෝස් (2) මෝල්ටෝස් (3) සෙලියුලෝස් (4) සුක්රෝස්

02. ලෙඩරෝගවලට එරෙහිව ක්‍රියා කරන ප්‍රතිදේහ නිපදවීමට හා තුවාල ඉක්මනින් සුවවීම කෙරෙහි බලපෑනු ලබන ප්‍රධාන පෝෂ්‍ය පදාර්ථයකි.
(1) මේදය (2) ප්‍රෝටීන් (3) පිෂ්ඨය (4) විටමින්

03. ආහාර 1g කින් කිලෝජුල් 17ක ශක්ති ප්‍රමාණයක් සපයන පෝෂ්‍ය පදාර්ථ ඇතුලත් කාණ්ඩය වනුයේ,
(1) මේදය හා ප්‍රෝටීන් (2) විටමින් හා පිෂ්ඨය
(3) ප්‍රෝටීන් හා කාබෝහයිඩ්‍රේට් (4) පිෂ්ඨය හා මේදය

04. බෝ නොවන රෝගවලින් වැළකී දිගුකල් සෞඛ්‍ය සම්පන්නව සිටීමට අවශ්‍ය ප්‍රතිඔක්සිකාරක අඩංගු පෝෂ්‍ය පදාර්ථ දෙකකි.
(1) විටමින් A හා C ය. (2) විටමින් A හා B ය. (3) විටමින් B හා D ය. (4) විටමින් D හා E ය.

05. * මන්ද බුද්ධික දරුවන් බිහිවීම
* ශ්‍රවන හා කථන ආබාධ සහිත දරුවන් බිහිවීම.
* ක්‍රෙටිනතාව
මෙම රෝග තත්වයන් කුමන පෝෂකයක් ඌණ වීම නිසා ඇතිවිය හැකි ද?
(1) විටමින් A (2) කැල්සියම් (3) විටමින් K (4) අයඩින්

06. හෘද රෝගීන්ට මාළු ආහාරයට ගැනීම හිතකර වීමට බලපාන හේතු සාධකය වන්නේ,
(1) ඔමේගා 3 මේද අම්ලය අඩංගු වීම. (2) යකඩ ලබා දීම.
(3) ප්‍රතිඔක්සිකාරක ලෙස ක්‍රියා කිරීම. (4) රෙටිනෝල් අඩංගු වීම.

07. පෝෂණ වගුවට අනුව කැල්සියම් බහුල පලා වර්ගයකි.
(1) මුකුණුවැන්න (2) ගොටුකොළ (3) කතුරුමුරුංගා (4) තම්පලා

08. නොපිසූ ආහාර 100g ක අඩංගු පෝෂක ප්‍රමාණ දක්වෙන්නේ,
(1) පෝෂණ වගුවෙහි ය. (2) දෛනික පෝෂණ අවශ්‍යතා සටහනෙහි ය.
(3) ආහාර පිරමීඩයෙහි ය. (4) ආහාර පිඟානෙහි ය.

09. බිත්තර සුදු මදයේ අඩංගු ප්‍රෝටීනය හඳුන්වන්නේ,
(1) කොලැජන් ලෙස ය. (2) ඇල්බියුමින් ලෙස ය.
(3) ඉලාස්ටින් ලෙස ය. (4) කෙයින් ලෙස ය.

10. සත්ව ආහාරවල අඩංගු විටමින් A හඳුන්වන රසායනික නාමය වන්නේ,
(1) රෙටිනෝල් ය. (2) කැරොටීන් ය. (3) ඇල්බියුමින් ය. (4) ලයිසීන් ය.

11 20 C° සිට 30 C° උෂ්ණත්ව පරාසය හඳුන්වන්නේ,

(1) ආහාර කල් තබා ගැනීමේ උෂ්ණත්වය ලෙස ය. (2) අයිස් මිදෙන උෂ්ණත්වය ලෙස ය.

(3) මස් මාළු නරක්වන උෂ්ණත්වය ලෙස ය. (4) කාමර උෂ්ණත්වය ලෙස ය.

12. රාත්‍රී ආහාරයට තෝසේ සෑදීම අම්මා කැමැත්තෙන් කළා ය. මෙහි ඇති ආහාරය පිසීමේදී තාප සංක්‍රාමණ ක්‍රමය කුමක් ද?

(1) සංවහනය (2) සන්නයනය (3) විකිරණය (4) ඉහත සියල්ලම

13. ආහාරය තුළ එන්සයිමීය ක්‍රියාකාරීත්වය නිසා සිදුවන මේරීම, පැසීම, ඉදීම, කුණුවීම වැනි ක්‍රියාවලිය හඳුන්වන්නේ,

(1) ඔක්සිකරණය ලෙස ය. (2) ස්වයංවියෝජනය ලෙස ය.

(3) ඔක්සිහරණය ලෙස ය. (4) විජලනය ලෙස ය.

14. බටහිර පන්නයට අනුව මේසය පිළියෙල කිරීමේදී බොජුන්පතෙහි මස් වර්ග ඇතුලත් කර ඇති විට අනිවාර්යයෙන් තැබිය යුතු සංග්‍රහ උපකරණ වන්නේ,

(1) පිහිය හා ආහාර ගන්නා හැන්ද (2) අත් පිස්නාව හා ගෑරුප්පුව

(3) ගෑරුප්පුව හා සුප් හැන්ද (4) ගෑරුප්පුව හා පිහිය.

15. සිල්වර් සර්විස් යනුවෙන් හැඳින්වෙන ආහාර පිළිගැන්වීමේ ක්‍රමය වන්නේ,

(1) ඇමරිකන් ක්‍රමවේදයට ආහාර පිළිගැන්වීම ය. (2) ප්‍රංශ ක්‍රමවේදයට ආහාර පිළිගැන්වීම ය.

(3) ජර්මන් ක්‍රමවේදයට ආහාර පිළිගැන්වීම ය. (4) බුෆේ ක්‍රමවේදයට ආහාර පිළිගැන්වීම ය.

16. එළවළු කැපීමේදී දිග, පළල, ඝනකම මි. මි. 5ක හතරැස් කොටු ආකාරයට කැපීම හඳුන්වන්නේ,

(1) ජූලියන් ක්‍රමය ලෙස ය. (2) මසදුවාන් ක්‍රමය ලෙස ය.

(3) බෲනුවාස් ක්‍රමය ලෙස ය. (4) පෙයිසෑන් ක්‍රමය ලෙස ය.

17. පොලිෆිනෝල් ඔක්සිඩේස් ක්‍රියාකාරීත්වය ඇති වන්නේ,

(1) පිසීම කරනලද අන්නාසිවල ය. (2) තම්බාගත් මඤ්ඤොක්කාවල ය.

(3) කැබලිකරගත් ඇපල්වල ය. (4) පැසීම සිදුවූ මධ්‍යසාරවල ය.

18. පරීක්ෂණයේදී ආහාරයේ pH අගය අඩුකිරීම සඳහා භාවිතා කරන ද්‍රව්‍යයකි.

(1) ලුණු (2) මී පැණි (3) සීනි (4) විනාකිරි

19. ප්‍රතිශක්තිය දුර්වල වීම නිසා ආසාදනවලට පහසුවෙන් ගොදුරු වීම හා ඉදිමාව කුමන පෝෂණ ඌනතාවයක ලක්ෂණයක් ද?

(1) නීරක්තිය (2) ක්වෝෂියෝකෝර් (3) යකඩ ඌනතාවය (4) මැරස්මස්

20




මෙයින් අලුත් බිත්තරය ඇත්තේ කුමන භාජනය තුළ ද?

(1) B ය. (2) D ය. (3) A ය. (4) C ය.

21 ආහාර සකස් කිරීමේදී පිපීමට භාජනය කරන අවස්ථා ඇත. පිපීම මගින් මූලිකව බලාපොරොත්තු වන්නේ,

(1) ආහාරයේ ප්‍රමාණය වැඩිකර ගැනීමයි.

(2) ආහාරයට රසයක් ලබා ගැනීමයි.

(3) ආහාරය විශාල කර පෙන්වීමයි.

(4) ආහාරයේ වයනය මෘදු වී ආහාරයට සැහැල්ලු බවක් ලබා දීමයි.

22. අයඩින් ඌනතාවය නිසා ඇතිවන මික්සෝඩිමා තත්ත්වය බහුලව දැකිය හැක්කේ,

(1) ළමාවියේ දරුවන් තුළ ය.
(2) වැඩිහිටියන් තුළ ය.
(3) ගර්භනී මව්වරුන් තුළ ය.
(4) යොවුන් අවධියේ දරුවන් තුළ ය.

23. නවයොවුන් වියේදී ගන්නා කැල්සියම් ශරීරගත නොවීම නිසා වැඩිහිටි අවධියේදී ඇතිවිය හැකි ඌනතා රෝගයකි.

(1) ඔස්ටියෝ පොරෝසිස්
(2) රිකට්ස්
(3) පිටකොන්දේ වේදනා
(4) ඔස්ටියෝ මැලේෂියා

24. යොවුන් වියෙහි චිත්තවේග ප්‍රකාශනයෙහි ස්වභාවය වනුයේ,

(1) තීව්‍ර බව හා ස්ථිර බව ය.
(2) කෙටිකාලීන හා ප්‍රබල බව ය.
(3) ක්ෂණික බව හා තීව්‍ර බව ය.
(4) ස්ථිර බව හා ක්ෂණික බව ය.

25. ටෙස්ටොස්ටෙරොන් ලෙස හඳුන්වනු ලබන්නේ කුමන හෝමෝන වර්ගයක් ද?

(1) ස්ත්‍රී ප්‍රජනක හෝමෝන
(2) ආහාර ජීර්ණ හෝමෝන
(3) පුරුෂ ප්‍රජනක හෝමෝන
(4) ශරීර වර්ධක හෝමෝන

26. ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ රූප සටහනක් ඔබට ඉදිරිපත් කර ඇත.




* යුක්තානුවක් සකස් වීම, * පරිනත ඩිම්බ මුදා හැරීම, * අධිරෝපනය සිදුවීම යන කාර්යයන් ,සිදුවන්නේ රූප සටහනෙහි කුමන අක්ෂරවලින් දැක්වෙන කොටස් වලදී ද?

(1) A, C, B
(2) B, E, C
(3) A, D, E
(4) C, E, D

27. ගර්භණී අවධියට අයත් කාලසීමාව සති,

(1) 32 කි.
(2) 36 කි.
(3) 40 කි.
(4) 44 කි.

28. ගැටයක් යොදා මැසීම ආරම්භ කරන එකම මැහුම් ක්‍රමය,

(1) සිහින් නූල් දුවවීම
(2) නූල් ඇදීම
(3) පිස්මේන්තු මැස්ම
(4) වාටි මැස්ම

29. ගෘහපිළිවල අද්දර අලංකාරකර ගැනීමට රේන්ද ඇල්ලීම, බදන යෙදීම, රැලි පටි ඇල්ලීම සිදුකරයි. එය හඳුන්වන්නේ

(1) ක්විල්ට් කිරීම නමිනි.
(2) විසිතුරු සැරසිලි නමිනි.
(3) නිර්මාණාත්මක සැරසිලි නමිනි.
(4) අක් සැරසිලි නමිනි.

30. සිරුරේ හැඩය ඉස්මතුකර දැක්වීම සඳහා යොදන ශිල්පීය මැහුම් ක්‍රමයකි.

(1) සිහින් ඔපනැලි
(2) යටකුරු පොලව්
(3) බදන යෙදීම
(4) ආර

31. මහන යන්ත්‍රයේ මැහුම් ලෙස දිස්වන අතින් මසා ගන්නා මැහුම් ක්‍රමය වන්නේ,

(1) පිස්මේන්තු මැස්ම ය.
(2) හීන් නූල් දුවවීම ය.
(3) සැඟිවාටි මැස්ම ය.
(4) සන්නාලි මැස්ම ය.

32. මැස්මෙහි සමානතාවක් පෙන්නුම් කරනුයේ,

(1) නැටි හා කතිර මැස්ම ය.
(2) දම්වැල් හා ලේසිඩේසි මැස්ම ය.
(3) කතිර හා දම්වැල් මැස්ම ය.
(4) ලේසිඩේසි හා නැටි මැස්ම ය.

33. බ්ලැන්කට් මැස්ම පිළිබඳ කසුනි ඉදිරිපත් කළ කරුණු පහත දක්වා ඇත.

(1) විසිතුරු මැහුම් ක්‍රමයකි.
(2) සෘජු බොත්තම් කාසවල අද්දර මැසීමට යොදා ගනියි.
(3) ඔපනැලි මැසීමට භාවිතා කරයි.
(4) බීක්කු මැසීමට යොදා ගනියි.

මේවා අතරින් නිවැරදි පිළිතුරක් නොවන්නේ,

(1) 2 ය.
(2) 3 ය.
(3) 4 ය.
(4) 1 ය.

34. A- අත්කට B- වාටිය මැසීම C- විවරය මැසීම

D- උරහිස මූට්ටුව මැසීම E- කර මැසීම

ළදරු ගවුම මැසීමේ අනුපිළිවෙල වන්නේ,

(1) DCEAB ය. (2) DABEC ය. (3) EDCBA ය. (4) ABCDE ය.

35. ඔබ විසින් මසනලද ළදරු ගවුමේ කිහිලි නැම්ම ශක්තිමත් කිරීමට යෙදූ උපක්‍රමය වන්නේ,

(1) වාටිය නමා මැසීම. (2) සැගිවාටි මැස්ම යෙදීම.

(3) සිහින් වාටියක් නමා මැසීම. (4) බ්ලැන්කට් මැස්ම කීපයක් යෙදීම.

36. පවුලේ ශ්‍රම සැපයුම තුළින් ලැබෙන ආදායම සමසේ භුක්ති විඳීම ආවේනික ලක්ෂණයක් කර ගන්නේ,

(1) න්‍යෂ්ටික පවුල ය. (2) විස්තෘත පවුල ය.

(3) පරම්පරානුගත පවුල ය. (4) නාගරික පවුල ය.

37. බිම් සැලසුම් ඇඳීමේදී අවධාරණය කළ යුතු කරුණු පිළිබඳ විමසීමේදී සිසුන් කීප දෙනෙකු ඉදිරිපත් කළ කරුණු පහත දක්වා ඇත.

1. නිවසේ දෙවන නිදන කාමරය අවම වශයෙන් වර්ග අඩි 120ක් විය යුතු ය.
2. එක් කාමරයක් තුළින් තවත් කාමරයකට ගමන් මං යෙදිය හැක.
3. කාමරවල වර්ග ප්‍රමාණයෙන් $\frac{1}{15}$ දොර සඳහා යෙදිය යුතු ය.
4. හැකිතාක් දුරට සමාන්තර බිත්තිවලට සුදුසු ලෙස දොර ජනේල යෙදිය යුතු ය.
5. කාමරවල වර්ග ප්‍රමාණයෙන් $\frac{1}{9}$ ජනේල සඳහා යොදා ගත යුතු ය.

ඉහත දක්වා ඇති කරුණු අතරින් නිවැරදි කරුණු වන්නේ,

(1) 1, 3 සහ 5 ය. (2) 3 සහ 4 ය. (3) 2, 3 සහ 5 ය. (4) 2 සහ 3 ය

38. සීමිත ඉඩකඩ සහිත නිවසක අභ්‍යන්තරය සංවිධානය කිරීමේදී නොකළ යුතු ක්‍රියාවක් වන්නේ,

(1) විසිත්ත කාමර පුටු කට්ටලය සමග කවිච්චිය තැබීම.

(2) තරප්පු පෙළ යට පොත් රාක්කය තැබීම.

(3) නිදන කාමරයේ තට්ටු ඇඳන් තැබීම ය.

(4) කාමරවල බිත්ති කබඩ් සවි කිරීම ය.

39. 1. විවිධ කාර්යයන්හි නිරතවීම සඳහා පුද්ගලයකු සතු හැකියාව.
2. ඉගෙනීමෙන් හා අත්දැකීම් තුළින් ලබාගන්නා හා අවබෝධ කරගත් දේ.
3. පුද්ගලයෙකු විසින් විවිධ කාර්යය සඳහා යොදා ගන්නා කායික හා මානසික ශක්තිය.
4. පුද්ගයෙකුගේ සිතෙහි ඇතිවන හිතකර හා අහිතකර හැඟීම්
5. අවශ්‍යතා ඉටුකර ගැනීමේදී පුද්ගලයෙකු තුළ ඇති භූමිකා.

මේවායින් පිළිවෙලින් ශ්‍රමය හා දැනුම යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) 1 හා 5 ය. (2) 5 හා 3 ය. (3) 2 හා 4 ය. (4) 3 හා 2 ය.

40. ජාතික සම්පතක් යන ආකල්පය ඇතිව අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කළ යුතු ගෘහීය සම්පත් වන්නේ,

(1) දේපල හා විදුලිය (2) ඉඩකඩ හා විදුලිය (3) ජලය හා විදුලිය (4) මුදල් හා විදුලිය

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018
# ගෘහ ආර්ථික විද්‍යාව - II

10 ශ්‍රේණිය | කාලය පැය 02 යි.

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

(01)

| පවුලේ සාමාජිකයාගේ නම | වයස | රැකියාව | ගෘහ මූලිකයාට ඇති ඥාතිත්වය |
|---|---|---|---|
| සුනිමල් වීරසේකර | අවුරුදු 48 | රජයේ ලිපිකරු | ගෘහමූලිකයා |
| රමණි වීරසේකර | අවුරුදු 44 | පවුල් සෞඛ්‍ය සේවිකා | බිරිඳ |
| පුංචිබණ්ඩා දිසානායක | අවුරුදු 73 | ගොවිතැන | මාමණ්ඩිය |
| විමලාවතී මැණිකේ | අවුරුදු70 | - | නැන්දනිය |
| සමන්තිකා වීරසේකර | අවුරුදු 17 | ශිෂ්‍ය | දුව |
| සජිත වීරසේකර | අවුරුදු 12 | ශිෂ්‍ය | පුතා |
| පමිතා වීරසේකර | අවුරුදු 04 | පෙරපාසල් | දුව |

ඉහත දක්වෙන්නේ ග්‍රාම නිලධාරී වෙතතොරතුරු ඉදිරිපත් කිරීම පිණිස සුනිමල් විසින් සම්පූර්ණ කරනලද ආකෘති පත්‍රයකි.

(1) සුනිමල්ගේ පවුල කිනම් පවුල් වර්ගයට අයත් ද?

(2) පුංචිබණ්ඩා සහ විමලාවතී දෙපල සුනිමල්ගේ පවුලේ සාමාජිකයන් වීම හේතුවෙන් එම පවුලට අයත්වන වාසි දෙකක් ලියන්න.

(3) රමණිට ආහාර පිසීමේ කටයුතු සඳහා උපයෝගී වන භෞතික සම්පත් හතරක් නම් කරන්න.

(4) බාල දියණිය වන පමිතාට ආහාර සැකසීමේදී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න.

(5) පුංචිබණ්ඩාගේ ගෙවත්තේ වගා කර ඇති භෝගවල අඩංගු කහපාට හා කොළපාට වර්ණක පිළිවෙලින් ලියන්න.

(6) පුංචිබණ්ඩා හා විමලාවති සඳහා සුදුසු රාත්‍රී ආහාර වේලක බොජුන්පතක් ලියන්න.

(7) ගෙවත්තෙන් ලබා ගන්නා ආහාර පරිරක්ෂණය සඳහා යොදාගත හැකි පරිරක්ෂණ කාරක දෙකක් සඳහන් කරන්න.

(8) ප්‍රාථමික ලිංගික ලක්ෂණ පහළවීම කෙරෙහි සම්බන්ධ හෝමෝන ස්‍රාවයකරන ග්‍රන්ථිය නම් කරන්න.

(9) කෑම කාමරයෙහි ක්‍රියානුරූපි බවට අදාලව සකසා ගතහැකි උපාංග දෙකක් සඳහන් කරන්න.

(10) මාතෘ සායනයට පැමිණෙන ගර්භනී මව්වරුන් වෙනුවෙන් එක් වරක් පමණක් සිදු කරන පරීක්ෂාව කුමක් ද?

02 (i) ක්‍ෂුද්‍ර ඛනිජ යන්න හඳුන්වන්න.

(ii) පෝෂණ වගුවෙහි විවිධ කාණ්ඩ යටතේ ආහාර ගොනු කර ඇත. එහිදී ඔබ හඳුනාගත් ආහාර කාණ්ඩ හයක් නම් කරන්න.

(iii) පෝෂ්‍ය කොටස් ආරක්‍ෂා වන පරිදි ආහාර සැකසීමට ඔබ විසින් අනුගමනය කරන ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න.

03 (i) (අ) 'පිරිසැලසුම' යන්න හඳුන්වන්න.

(ආ) විවර පියවීමට යොදාගන්නා ක්‍රම හතරක් සඳහන් කරන්න.

(ii) ඇඳුම් නිර්මාණයේදී භාවිතා කරන පහත දක්වා ඇති මෙවලම් හා ද්‍රව්‍ය වලින් ඇති ප්‍රයෝජන සඳහන් කරන්න.

- දැති රෝදය • එම්බ්‍රොයිඩරි කතුර • සන්නාලි හුණු

(iii) විකර්ණාකාර පටි කපා මූට්ටු කරන ආකාරයට රූප සටහන් සහිතව පියවර තුනකින් පැහැදිලි කරන්න.

04 (i) බහු කාර්ය ඒකක යන්න උදාහරණ සහිතව හඳුන්වන්න.

(ii) නිදන කාමරයට ජනෙල් යෙදීමේදී අවධානය යොමු කළ යුතු කරුණු තුනක් සඳහන් කරන්න.

(iii) ආලින්දය, විසිත්ත කාමරය, නිදන කාමර දෙකක්, මුළුතැන්ගෙය, නාන කාමරය සහ වැසිකිලිය යන කොටස් ඇතුලත් ගෙබිමක දළ සැලැස්මක් අඳින්න.

(පරිමාණයට ඇඳීම අවශ්‍ය නොවේ.)

05 (i) ළදරු ඇඳුම් සඳහා කපු රෙදි යෝග්‍ය වේ. හේතු තුනක් සඳහන් කරන්න.

(ii) (අ) කපු රෙදි හඳුනාගැනීම සඳහා ඉටු කරන ලද පුළුස්සා බැලීම යන සරල පරීක්‍ෂයේදී ඔබ ලබාගත් නිරීක්‍ෂණ හතරක් සඳහන් කරන්න.

(ආ) රෙදි පිරියම් කළ යුත්තේ ඇයි? කරුණු දෙකක් සඳහන් කරන්න.

(iii) ඇඳුමක් සඳහා පතරොම් නිර්මාණය කිරීමේදී පහත දැක්වෙන අවස්ථාවල මිනුම් පටිය භාවිතා කරන ආකාරය පැහැදිලි කරන්න.

1. සෘජු මිම් සටහන් කිරීම.
2. කවාකාර රේඛා මත මිම් සටහන් කිරීමේදී

06 (i) 'විසරණය' යන්න අර්ථ දක්වන්න.

(ii) ශීතනය හා අධිශීතනය යන පරිරක්‍ෂණ ක්‍රමවලට අදාල පරිරක්‍ෂණ මූලධර්ම පිළිවෙළින් සඳහන් කරන්න.

(iii) විධිමත් ක්‍රමයට තේ පිළිගැන්වීමට අවශ්‍ය තේ කට්ටලයට අයත් උපකරණ නම් කරන්න.

07 (i) 'මොරියුලාව' යනු කුමක්දැයි හඳුන්වන්න.

(ii) යෞවන වියේ අවධි තුන කාල පරාස සමඟ සඳහන් කරන්න.

(iii) නව යොවුන් අවධියේදී මානසික වර්ධනය බාහිරව පෙන්නුම් කරන ලක්‍ෂණ හතරක් සඳහන් කරන්න.